## නේෂන්ස් පුද්ගලික ආයෝජන සැලසුම් ගිණුම  නියමයන් සහ කොන්දේසි

නේෂන්ස් ට්‍රස්ට් පීඑල්සී-පීකිවු 118 බැංකුවේ (මෙහි මින්මතු "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන) විවෘතකර පවත්වාගෙන යනු ලබන නේෂන්ස් පුද්ගලික ආයෝජන සැලසුම් ගිණුම් පහත දැක්වෙන නියමයන් සහ කොන්දේසි මගින් පාලනය වනු ඇත.

<u>ගිණුම විවෘත කිරීම</u>

1. බැංකුව මගින් පිළිගනු ලබන සම්මත අනන්‍යතා තහවුරු කිරීමේ ක්‍රියාවලියක් මගින් සිදුකරනු ලබන ධනාත්මක හඳුනාගැනීමක් මත බැංකුව මගින් අනුමත කරනු ලබන වයස අවුරුදු 18 ට වැඩි ඕනෑම පුද්ගලයෙකුට නේෂන්ස් පුද්ගලික ආයෝජන සැලසුම් ගිණුමක් (එන්පීඅයිපී ගිණුම) විවෘත කළ හැකිය.

2. බැංකුව සමග සිදුකරනු ලබන සියළුම ලිපි හුවමාරු වලදී සහ සියළුම මුදල් තැන්පතු පත්‍රිකාවල සඳහන් කළයුතු අංකයක් සෑම එන්පීඅයිපී ගිණුමකටම ලබාදෙනු ඇත. එසේ ලබාදෙනු ලබන අංකය ගනුනෙකරුට දැනුම්දීමක් සහිතව වෙනස් කිරීමේ අයිතිය බැංකුව සතුවේ.

<u>**කල්පිරීමේ ඉලක්කගත මුදල සහ කල්පිරීමේ දිනය**</u>

3. රු. 100,000/- ක අවම කල්පිරීමේ ඉලක්කගත මුදලකින් සහ රු. 10,000,000/- ක උපරිම කල්පිරීමේ ඉලක්කගත මුදලකින් එන්පීඅයිපී ගිණුමක් ආරම්භ කළ හැකිය.

   **"කල්පිරීමේ දිනය"** යනු මෙම නියමයන් සහ කොන්දේසි යටතේ කල්පිරීමේ ඉලක්කගත මුදල ගනුදෙනුකරුට ලැබෙන දිනයයි.

   **"කල්පිරීමේ ඉලක්කගත මුදල"** යනු මෙම නියමයන් සහ කොන්දේසි වලට යටත්ව එන්පීඅයිපී ගිණුම කල්පිරෙන දිනට ලබාගැනීම සඳහා ගනුදෙනුකරු බැංකුව සමග ගිවිසුම්ගත වන මුදලයි.

4. කල්පිරීමේ ඉලක්කගත මුදල, වසර 02ක අවම කාලසීමාවකින් සහ වසර 05ක උපරිම කාලසීමාවකින් හෝ කලින් කලට බැංකුව විසින් නියම කර අවසර ලබාදිය හැකි වෙනත් කාලසීමාවකින් ලබාගැනීමට ගනුදෙනුකරුට තෝරාගත හැකිය.

5. ඉහත 4 වගන්තියට යටත්ව එන්පීඅයිපී ගිණුමක් ආරම්භ කරන අවස්ථාවේදී , ගනුදෙනුකරු විසින් ගිණුම් විවෘත කිරීමේ පත්‍රිකාවේ සඳහන් කරනු ලබන කල්පිරීමේ ඉලක්කගත මුදලක් තෝරාගත යුතුය. ඒ අනුව මෙම නියමයන් සහ කොන්දේසිවලට යටත්ව එන්පීඅයිපී ගිණුමකට ගනුදෙනුකරු විසින් තැන්පත් කළ යුතු මුදල සහ ගනුදෙනුකරු විසින් තෝරාගන්නා ලද කල්පිරීමේ දිනයේදී කල්පිරීමේ ඉලක්කගත මුදල ලැබීමට හැකිවීම සඳහා එකී වාරික මුදල අයවිය යුතු දිනය බැංකුව විසින් ගණනයකර ඒ පිළිබඳව උපදෙස් ලබාදෙනු ඇත.

<u>වාරික</u>

6. (අ) මූලික තැන්පතු මුදල" ඉලක්කගත කල්පිරීමේ අගය, අයෝජන කාල සීමාව සහ ගිවිසුම්ගත පොළී අනුපාතය පිළිබඳව සළකාබලා බැංකුව මගින් මාසික වාරික අගය ගණනය කරනු ඇත.

   (b) එම මාසික වාරික මුදල එය අයවිය යුතු දිනට හෝ ඊට පෙර එන්පීඅයිපී ගිණුමට තැන්පත් කිරීමට ගනුදෙනුකරු එකඟ වේ.

ගනුදෙනුකරු විසින් තෝරාගන්නා ලද කල්පිරීමේ ඉලක්කගත මුදල ලබාගැනීමට සුදුසුකම් ලැබීම සඳහා කල්පිරීමේ දිනය දක්වා මාසික වාරික මුදල නියමිත දිනට හෝ ඊට පෙර සම්පූර්ණයෙන්ම තැන්පත් කිරීම අනිවාර්ය වේ. බැංකුව විසින් නියම කරනු ලැබ ඇති පරිදි මාසික වාරික මුදල නියමිත දින හෝ ඊට පෙර සම්පූර්ණයෙන්ම ගෙවීමට ගනුදෙනුකරු අපොහොසත් වන අවස්ථාවකදී කල්පිරීමේ ඉලක්කගත මුදල කල්පිරෙන දිනට ගනුදෙනුකරුට නොලැබෙනු ඇත.

7. 2020 ඔක්තෝබර් 15වන දින සිට ක්‍රියාත්මක වන පරිදි එන්පීඅයිපී ගිණුමක් ආරම්භ කිරීමට සුදුසුකම් ලැබීම සඳහා එන්පීඅයිපී ගිණුමට මාසික වාරික මුදල් තැන්පත් කිරීමට බැංකුවේ පවත්වාගෙන යනු ලබන ඉතුරුම්/ජංගම ගිණුමකින් ස්ථාවර උපදෙස් ලබාදිය යුතුය.

කෙසේවුවත් එන්පීඅයිපී ගිණුම සඳහාවන තැන්පතු ලෙස මුදල් සහ ගනුදෙනුකරු නමට ලියන ලද චෙක්පත් බැංකුව මගින් භාරගනු ලැබිය හැකිය. අනෙක් බැංකු නමට ලියන ලද චෙක්පත් තැන්පතු පිළිබඳ වන අවස්ථාවකදී චෙක්පත් නිෂ්කාශණය වී ඇත්නම් සහ නියමිත දිනට එන්පීඅයිපී ගිණුමට වාරික මුදල බැරවී ඇත්නම් පමණක් වාරික මුදල එන්පීඅයිපී ගිණුමට තැන්පත්වී ඇති ලෙස සළකනු ලැබේ.

8. පහත 28 වගන්තියේ දක්වා ඇති පරිදි හැර, කල්ඉකුත්වීමේ දිනට පෙර එන්පීඅයිපී ගිණුමෙන් මුදල් ආපසු ලබාගැනීමට ගනුදෙනුකරුට අවසර දෙනු නොලැබේ.

**<u>කල්ඉකුත්වීමේදී පොලිය සහ ගෙවීම</u>**

9. එන්පීඅයිපී ගිණුම ආරම්භ කරනු ලන අවස්ථාවේදී බැංකුව මගින් තීරණය කරනු ලබන පොලිය, එන්පීඅයිපී ගිණුමේ දෛනික ශේෂය මත ගණනය කර කල්පිරීමේ දිනය දක්වා එන්පීඅයිපී ගිණුමට මාසිකව බැරකරනු ඇත. නීතිය මගින් හෝ රෙගුලාසි මගින් හෝ මෙම නියමයන් සහ කොන්දේසි මගින් පොලී අනුපාත වෙනස් කිරීමට අවශ්‍ය වන්නේ නම් එසේ කිරීමට බැංකුවට අයිතිය ඇත.

10. ගනුදෙනුකරු මෙම නියමයන් සහ කොන්දේසිවලට අනුකූලව කටයුතු කරන්නේනම්, කල්පිරීමේ දිනට හෝ නීතිය මගින් අවශ්‍ය කරනු ලබන ආයෝජන කාල සීමාව තුළ අදාළ රජයේ බදු සහ වෙනත් ව්‍යවස්ථාපිත බදු අඩුකිරීමට යටත්ව බැංකුව මගින් කල්පිරෙන දින කල්පිරීමේ ඉලක්කගත මුදල ගෙවනු ඇත.

11. කල්පිරීමේ දිනට පෙර කල්පිරීමේ ඉලක්කගත මුදලට ළඟාවීම සඳහා ගනුදෙනුකරු විසින් එන්පීඅයිපී ගිණුමට එක්වරක් පමණක් සිදුකරනු ලබන මුදල් තැන්පතු කිරීමක් සිදුකළ හොත් කල්පිරීමේ ඉලක්කගත මුදලට ඒළඹී දිනසිට ඒන්පීඅයිපී ගිණුමට අදාළවන ගිවිසුම්ගත පොලී අනුපාතය බැංකුව මගින් නතර කරනු ඇති අතර කල්පිරීමේ දිනය දක්වා බැංකුවේ සම්මත ඉතුරුම් ගිණුමක් හෝ බැංකුව මගින් තීරණය කරනු ලබන අනුපාතයක් මත පොලිය ගණනය කරනු ඇත.

12. යම්කිසි දෙනලද කාලසීමාවක් තුළ ගනුදෙනුකරු විසින් මාසික වාරික මුදලට අවශ්‍ය ප්‍රමාණයට වඩා හෝ ඒකී වාරික මුදල මෙන් කිහිපගුණයක් මුදල් තැන්පත්කර කල්පිරීමේ දිනට පෙර කල්පිරීමේ ඉලක්කගත මුදල සපුරා ඇත්නම්, ඒන්පීඅයිපී ගිණුමට අදාළ ගිවිසුම්ගත පොලී අනුපාතය බැංකුව මගින් නතර කරනු ඇත.

13. ගනුදෙනුකරු විසින් කල්පිරීමේ ඉලක්කගත මුදලට ළඟා වී තිබුණ ද නොතිබුණ ද, කල්පිරීමේ දිනයේදී එන්පීඅයිපී ගිණුමේ පොලී අනුපාතය සම්මත ඉතුරුම් ගිණුම් අනුපාතයකට හෝ බැංකුව මගින් නිර්ණය කරනු ලබන වෙනත් අනුපාතයකට පරිවර්තනය වනු ඇත.

14. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් ඉල්ලා සිටිනු ලබන පරිදි ගනුදෙනුකරු විසින් තම බදු තත්වය සහ පදිංචි තත්වය පිළිබඳව ව්‍යවස්ථාපිත ප්‍රකාශයක් ගිණුම් විවෘත කිරීමේ පත්‍රිකාවේ සම්පූර්ණ කළ යුතුය.දේශීය ආදායම් දෙපාර්තමේන්තුව හෝ එකී කාර්යය සඳහා නීතිය මගින් නියම කරනු ලැබ ඇති වෙනත් අධිකාරියක් මගින් නියම කරනු ලබන පරිදි පොලී ගෙවීම් මත ගෙවිය යුතු වන රඳවුම් බද්ද හෝ වෙනත් යම් බදු මුදලක් බැංකුව මගින් අඩුකර ගනු ඇත. අදාළ අධිකාරිය මගින් පසුව ඉල්ලා සිටිනු ලැබ තිබෙනම් නොගෙවූ බදු මුදල් ගනුදෙනුකරුගෙන් අයකර ගැනීසට බැංකුවට අයිතිය ඇත.

<u>රක්ෂණය</u>

15. ගිණුම විවෘත කරනු ලබන අවස්ථාවේදී ගනුදෙනුකරු අවුරුදු හැට (60) සම්පූර්ණ කර නොමැතිනම් සහ ගන්දෙනුකරුගේ අයදුම්පත රක්ෂණ සමාගම මගින් පිළිගනුලැබීමට යටත්ව එන්පීඅයිපී ගිණුම විවෘත කර මාස 2ක් තුළ බැංකුව මගින් ගන්දෙනුකරු දසහා ජීවිත රක්ෂණ ආවරණයක් ලබාදෙනු ඇත.

16. කල්පිරීමේ ඉලක්කගත මුදල නොසළකා හැර රක්ෂණ ආවරණය රු. 2,000,000/-ක උපරිමයකට යටත් වනු ඇත.

මෙයින් ප්‍රකාශ වන්නේ , කල්පිරීමේ දිනට පෙර ගනුදෙනුකරු මියගිය අවස්ථාවකදී ලැබිය හැකි රක්ෂණ මුදල ගනුදෙනුකරු විසින් තෝරාගත් ඉලක්කගත කල්පිරීමේ මුදල සපුරාගත හැකි මුදලක් වන නමුත් ( ගනුදෙනුකරු මියයන අවස්ථාව වන විට එය සපුරා නොමැතිනම්) එය රු. 2,000,000/- නොඉක්මවන බවය. ( උදා:- කල්පිරීමේ ඉලක්කගත මුදල රු. 2,000,000/-ක් ඉක්මවන ගනුදෙනුකරුවකුගේ මරණයකදී සහ ගනුදෙනුකරුගේ මරණය සිදුවන අවස්ථාවේදී එන්පීඅයිපී ගිණුමෙහි ප්‍රාග්ධනය සහ උපයාගන්නා ලද පොලිය රු. 2,500,000/- වන්නේනම් රක්ෂණ මුදලක් ගෙවනු නොලැබේ.)

*උදා:-* (අ) මරණය සිදුවන අවස්ථාවකදී ගනුදෙනුකරුගේ එන්පීඅයිපී ගිණුමේ ශේෂය ( එන්පීඅයිපී ගිණුමේ ප්‍රාග්ධනය සහ උපචිත පොලිය) රු. 350,000/- සහ කල්පිරීමේ ඉලක්කගත මුදල රු. 1,000,000/- වන විට, රක්ෂණ ප්‍රතිලාභය රු. 650,000.00 වනු ඇත. ( එනම් රු. 1,000,000.00- රු. 350,000.00)

*උදා:-* (ආ) මරණය සිදුවන අවස්ථාවේදී ගනුදෙනුකරුගේ එන්පීඅයිපී ගිණුමේ ශේෂය රු. 350,000.00 සහ කල්පිරීමේ ඉලක්කගත මුදල රු. 3,000,000.00 වන විට රක්ෂණ ප්‍රතිලාභය රු. 1,650,000.00 ක් වේ. ( එනම් රු. 2,000,000.00 - රු. 350,000.00)

*උදා:-* (ඇ) මරණය සිදුවන අවස්ථාවේදී ගනුදෙනුකරුගේ එන්පීඅයිපී ගිණුමේ ශේෂය රු. 350,000.00 සහ කල්පිරීමේ ඉලක්කගත මුදල රු. 2,500,000.00 වන විට කිසිදු රක්ෂණ ප්‍රතිලාභයක් ගෙවනු නොලැබේ.

17. .ගනුදෙනුකරුගේ මරණය සිදුවන අවස්ථාව දක්වා ගනුදෙනුකරු විසින් මෙම නියමයන් සහ කොන්දේසිවලට අනුකූලව කටයුතු කර ඇති අවස්ථාවන්හිදී පමණක් මෙම රක්ෂණ ආවරණය යටතේ ප්‍රතිලාභ හිමිවේ.

18. ගනුදෙනුකරු විසින් අනුගාමී මාසික වාරික 2ක හිඟ ගබා ඇති අවස්ථාවකදී, රක්ෂණ ආවරණය අවසන්කරනු ඇත. එවැනි අවස්ථාවකදී, එවැනි පැහැරහැරීමක් සිදුකරන ලද වර්ෂය තුළ ගනුදෙනුකරු වෙනුවෙන් බැංකුව මගින් ගෙවන ලද රක්ෂණ වාරිකයේ (වාරිකවල) මුදල, ගනුදෙනුකරුගේ එන්පීඅයිපී ගිණුම හර කිරීම ද ඇතුළුව ගනුදෙනුකරුගෙන් අයකර ගැනීමට බැංකුවට හිමිකම් ලැබෙනු ඇත.

19. මෙම නියමයන් සහ කොන්දේසිවලට අනුකූලව කටයුතු කරමින් මාසික වාරික නියමිත කලට තැන්පත් කරන බවට සහතික වීම ගනුදෙනුකරුගේ වගකීම වේ. වාරික ගෙවීම ප්‍රමාදවීමේ හෝ කල්ඉකුත්වීමේ ප්‍රතිඵලයක් ලෙස රක්ෂණ ආවරණය යටතේ වන ප්‍රතිලාභ අහිමි වන විටෙක ඒ පිළිබඳව ගනුදෙනුකරුට දැනුම්දීමට බැංකුව බැඳී නොසිටින අතර ඒ සඳහා බැංකුවට වගකීමක් නොමැත. කෙසේවුවද, එම සිදුවීමට පෙර හෝ පසුව බැංකුව මගින් එහි තනි අභිමතය පරිදි එම අහිමිවීම පිළිබඳ දැන්වීමක් එවීමට හැකිය.

20. රක්ෂණ ආවරණය, රක්ෂණ සමාගමේ නියමයන් සහ කොන්දේසි වලට යටත්වනු ඇති අතර ගනුදෙනුකරු විසින් අවශ්‍යවන විට/අවශ්‍ය වන්නේ නම් සිදුකරන වෛද්‍ය ඇගයීම්ද ඇතුළුව එම සියලුම නියමයන් සහ කොන්දේසි වලට අනුකූලව කටයුතු කළ යුතුවේ.රක්ෂණ සමාගම මගින් යම්හෙයකින් ගනුදෙනුකරු රක්ෂණය කිරීමට අපොහොසත්වීම හෝ එසේ කිරීම ප්‍රතික්ෂේප කිරීම සිදුකරනු ලැබුවහොත් ඒ පිළිබඳව බැංකුව බැඳී නොසිටින අතර ගනුදෙනුකරුට වගකියනු නොලැබේ.රක්ෂණ සමාගමේ නියමයන් සහ කොන්දේසිවල පිටපතක් ඉල්ලුම්කළහොත් බැංකුව මගින් ගනුදෙනුකරුට ලබාදෙනු ඇත.

21. රක්ෂණ සමාගම ගින් සිදුකරන ලෙස ඉල්ලා සිටිනු ලබන යම් වෛද්‍ය ඇගයීමක්/පරීක්ෂණයක් සඳහාවන වියදම ගනුදෙනුකරු විසින් දැරිය යුතුය.

22. කල්පිරීමේ දින හෝ ගනුදෙනුකරු වයස අවුරුදු 60 එළඹීම මත රක්ෂණ ආවරණය අවසන් වනු ඇති අතර (පළමුව සිදුවන දෙය මත) ඉන්පසුව කිසිදු රක්ෂණ ප්‍රතිලාභයක් ගෙවනු නොලැබේ.

**<u>කල්පිරීමේ දිනට පෙර ගනුදෙනුකරු මියයාම</u>**

23. කල්පිරීමේ දිනට පෙර ගනුදෙනුකරු මියගියහොත් බැංකුව මගින් එන්පීඅයිපී ගිණුම වසාදමනු ඇති අතර, පහත 24 වගන්තියේ විධිවිධානයන්ට යටත්ව, අදාළවන නීතීන්ට අනුව එන්පීඅයිපී ගිණුමේ ශේෂය ගනුදෙනුකරුගේ නෛතික උරුමකරුවන්ට වෙනු ඇත.

24. එන්පීඅයිපී ගිණුමක් විවෘත කරන අවස්ථාවේදී හෝ ඉන්පසුව අදාළ නීති සහ නියමයන් අනුව සහ බැංකුවේ කොන්දේසිවලට යටත්ව ඕනෑම අවස්ථාවකදී නම්කිරීමේ පත්‍රිකාවක් සම්පූර්ණ කිරීම මගින්, කල්පිරීමේ දිනට පෙරාතුව ගනුදෙනුකරු මියගියහොත් අවසාන පියවීමේ මුදල ගෙවිය යුතු ප්‍රතිලාභියෙකු හෝ ප්‍රතිලාභීන් ගනුදෙනුකරුට නම්කළ හැකිය.

25. රක්ෂණ හිමිකම සකස් කිරීම සඳහා, ගනුදෙනුකරුගේ මරණය සිදුවූ දිනසිට මාස 2ක් තුළ ගනුදෙනුකරුගේ උරුමකරුවන්, පොල්මෑකරුවන් හෝ අද්මිනිස්ත්‍රාසිකරුවන් විසින් ඒ බව බැංකුවට දැනුම්දිය යුතුය. මෙම කාලසීමාව ඉකුත්වීමේ ප්‍රතිඵලයක් ලෙස රක්ෂණ හිමිකම ගෙවීමක් සිදු නොවනු ඇත.

## ගිණුම අවසන් කිරීම/වසාදැමීම

26. **පැහැරහැරීම:** ගනුදෙනුකරු විසින් අනුගාමී වාරික 2ක් නියමිත දිනට ගෙවීම පැහැර හැරියහොත් :

අ. එන්පීඅයිපී ගිණුම වසා දමා ආයෝජනය කරන ලද ප්‍රාග්ධන මුදල උපචිත පොලියද සමග ගනුදෙනුකරුට ගෙවීමට,

**හෝ**

ආ. කල්පිරීමේ දිනය දක්වා එන්පීඅයිපී ගිණුම පවත්වා ගැනීමට,

බැංකුවට අයිතිය ඇත.

27. ඉහත සඳහන් කරන ලද අවස්ථා දෙකේදීම, ගෙවීම් පැහැර හරින ලද අවසාන දින සිට එන්පීඅයිපී ගිණුම වසා දමන තෙක් හෝ කල්පිරීමේ දින දක්වා වන පොලිය (අදාළවන පරිදි) , බැංකුවේ සම්මත ඉතුරුම් ගිණුම් අනුපාතයට හෝ බැංකුව විසින් නිර්ණය කරනු ලබන පරිදි ගණනය කරනු ඇත. බැංකුව මගින් විසින් එන්පීඅයිපී ගිණුම අඛණ්ඩව පවත්වාගෙන යන විට ගනුදෙනුකරු හිඟ වාරික මුදල් පසුව තැන්පත් කළද මෙය සිදුවේ.

28. **කල්පිරීමට පෙර වසා දැමීම:** ව්‍යතිරේඛී අවස්ථාවන්හිදී සහ බැංකුවේ තනි අභිමතය පරිදි හැර එන්පීඅයිපී ගිණුම වසා දැමීමට සහ/හෝ කල්පිරීමේ දිනට පෙර එහි ශේෂය ආපසු ලබාගැනීමට ගනුදෙනුකරුට අවසර හිමි නොවේ. කල්පිරීමේ දිනට පෙර එන්පීඅයිපී ගිණුම වසා දැමීමට බැංකුව මගින් ගනුදෙනුකරුට අවසර ලබාදෙන අවස්ථාවකදී, ගිණුම විවෘත කළ දින සිට ගිණුම වසාදමන දිනය දක්වා වන බැංකුවේ සම්මත ඉතුරුම් ගිණුම් පොලිය හෝ බැංකුව මගින් නිර්ණය කරනු ලබන වෙනත් අනුපාතයක් බැංකුව මගින් අදාළ කරනු ඇති අතර ගනුදෙනුකරු විසින් ආයෝජනය කර ඇති මුදල මත බැංකුව මගින් දැනටමත් ගෙවා ඇති අතිරික්ත පොලිය අයකරගනු ඇත.

29. **බැංකුව මගින් වසා දැමීම:** ගනුදෙනුකරු විසින් බැංකුව වෙත ලබාදී ඇති අවසන් වරට දන්නා ලිපිනයට හෝ විද්‍යුත් තැපැල් ලිපිනයට දින 14කට පෙර ලිඛිත දැනුම්දීමක් සිදුකිරීම මගින්, බැංකුවේ පරම අභිමතය පරිදි සහ කිසිදු හේතුදැක්වීමකින් තොරව ඕනෑම අවස්ථාවක එන්පීඅයිපී ගිණුම වසාදැමීමට බැංකුවට අයිතිය ඇත.

30. ඉහත 26 හෝ 28 වගන්ති යටතේ දක්වා ඇති ඕනෑම තත්වයක් යටතේ බැංකුව විසින් හෝ ගනුදෙනුකරු විසින් එන්පීඅයිපී ගිණුම වසාදමනු ලැබුවහොත්, රක්ෂණයේ පිරිවැය සහ/හෝ එන්පීඅයිපී ගිණුමට අදාළව ප්‍රතිලාභ සහ සේවාවන් සැපීම ලබාදීමේදී බැංකුවට උපචිත වන්නට ඇති වෙනත් විශේෂිත පිරිවැයක් බැංකුවට එහි අභිමතය පරිදි අයකර ගැනීමට හැක.

31. මෙම නියමයන් සහ කොන්දේසි යටතේ ගිණුමක් වසා දැමීමේදී, ගනුදෙනුකරුට මුදල් නිදහස් කිරීමට පෙර අදාළ රජයේ බදු මුදල් හා ව්‍යවස්ථාපිත බදු සහ ගිණුම් වසාදැමීමේ ගාස්තු බැංකුව මගින් අඩුකරගනු ඇත.

32. එන්පීඅයිපී ගිණුම වසාදැමීම මගින් 41 වගන්තිය අනුව බැංකුවට හිමි අයිතීන්ට අගතියක් සිදු නොවනු ඇති අතර ඒ අනුව, 41 වගන්තිය යටතේ බැංකුවේ අයිතීන් ක්‍රියාත්මක කරනු ලබන තෙක් එන්පීඅයිපී ගිණුමේ මුදල් කවර හෝ බැඳීමක් යටතේ බැංකුව මගින් නිදහස් නොකරනු ඇත.

**පොදු කොන්දේසි**

33. ගනුදෙනුකරු විසිනු තෝරාගන්නා ලද එන්පීඅයිපී ගිණුමේ විස්තර සඳහන් කරන ආයෝජන පිළිබඳ දැන්වීමක් එන්පීඅයිපී ගිණුම ආරම්භ කරන අවස්ථාවේදී ගනුදෙනුකරුට නිකුත් කරනු ඇත.ගනුදෙනුකරුට පාස්පොත් නිකුත් කරනු නොලැබේ.

34. මුද්‍රිත හෝ ඉලෙක්ට්‍රොනික වශයෙන් ගනුදෙනුකරු විසින් තෝරාගන්නා ලද පරිදි ද්වි වාර්ශික ගිණුම් වාර්තා බැංකුව මගින් ගනුදෙනුකරුට ලබාදෙනු ඇත.කෙසේවුවද, තම අභිමතය පරිදි ප්‍රකාශන ලබාදෙන වාර සංඛ්‍යාව වෙනස්කිරීමට බැංකුවට අයිතිය ඇත.

35. බැංකුව මගින් ප්‍රකාශනවල පිටපත් තබාගනුයේ වසර 6ක (හෝ බැංකුව මගින් නිර්ණය කරනු ලබන වෙනත් කාලසීමාවක්) කාලසීමාවක් පමණි . එම සියලුම වාර්තා වසර 6කට පසුව විනාශ කරන අතර වසර 6කට පසුව පිටවපත් ලබාදීම පිළිබඳව බැංකුව කිසිදු වගකීමකට බැඳී නොසිටී.

36. ප්‍රකාශය ලැබීමට නියමිත දින සිට දින 15ක් (එනම් සෑම වසරකම ජූනි 20 වන දින සහ දෙසැම්බරු 31වන දින) තුළ ගිණුම් ප්‍රකාශය ගනුදෙනුකරුට නොලැබුණි නම් හෝ එහි විද්‍යුත් මාධ්‍ය ඔස්සේ එය නොලැබුණි නම් බැංකුවට ඒ පිළිබඳව උපදෙස් ලබාදිය යුතුය. සටහන් වල නිරවද්‍යතාවය සහතික කිරීම සඳහා සෑම ගිණුම් ප්‍රකාශයක්ම පරීක්ෂාකිරීමට ගනුදෙනුකරු එහක වේ. යම් වරදක් තිබේනම් ප්‍රකාශය ලැබී දින 21ක් තුළ බැංකුවට දැනුම්දිය යුතුය.

37. ඔහුගේ/ඇයගේ ප්‍රකාශනවල පිටපත් ආරක්ෂාකර ගැනීම පිළිබඳව ගනුදෙනුකරු වගකිව යුතුය.ප්‍රකාශන පිටපත් බැංකුවෙන් ඉල්ලුම් කරන විට, මෙම සේවාව ලබාදීම සඳහා එහි ප්‍රකාශකර ඇති බදු අනුව ගාස්තු අය කිරීමට බැංකුවට අයිතිය ඇත.

38. බැංකුවේ අභිමතය පරිදි මුදල් හෝ චෙක්පත් තැන්පතු සිදුකර නොමැතිනම් බැංකුව මගින් තැපැල් මගින් ඒ සඳහා වෙන් වෙන් උපදෙස් යවනු නොලැබේ.

39. ගනුදෙනුකරුගේ තැපැල් හෝ විද්‍යුත් ලිපිනයන් වල යම් වෙනසක් සිදු වුහොත් වුහොත් ඒ පිළිබඳව වහාම ලිඛිතව ගනුදෙනුකරු විසින් බැංකුවට දැනුම් දිය යුතුය.

40. මෙම නියමයන් සහ කොන්දේසි යටතේ විශේෂිතව දක්වා නොමැතිනම් එන්පීඅයිපී ගිණුම යටතේ වන ගනුදෙනුකරුගේ යම් අයිතීන් හෝ බැඳීම් ගනුදෙනුකරු විසින් පැවරීම හෝ මාරුකිරීම සිදු නොකළ යුතු අතර එවැනි ගනුදෙනුවක් හේතුවෙන් ඍජුව හෝ වක්‍රව සිදුවන යම් පාඩුවක් පිළිබඳව බැංකුව බැඳී නොසිටින අතර ඒ පිළිබඳව වගකියනු නොලැබේ.

41. මෙහි සඳහන් කවර හෝ කරුණකට අගතියකින් තොරව ගනුදෙනුකරුට දැනුම්දීමකින් තොරව එන්පීඅයිපී ගිණුම ගනුදෙනුකරුගේ වෙනත් කවර හෝ ගිණුමක් සමග හෝ බැංකුව සමග ගනුදෙනුකරුගේ ඇති වෙනත් යම් බැඳීමක් සමග ඒකාබද්ධ කිරීමට සහ තත්‍ය හෝ අසම්භාව්‍ය, ප්‍රාථමික හෝ අතිරේක සහ එක්ව සහ වෙන් වෙන්ව වන වෙනත් ඕනෑම ගිණුමක් මත ගනුදෙනුකරුගෙන් බැංකුවට හිමිවිය යුතු ඕනෑම මුදලක්/ මුදල් වලට එරෙහිව එන්පීඅයිපී ගිණුමේ හරට පවතින ඕනෑම මුදලක්/ මුදල් හිලවු කිරීමට හෝ මාරු කිරීමට බැංකුවට අයිතිය ඇත.

42. ඕනෑම අවස්ථාවක තම පරම අභිමතය පරිදි මෙම නියමයන් සහ කොන්දේසි වෙනස් කිරීමට,සංශෝධනය කිරීමට හෝ එකතු කිරීමට බැංකුවට අයිතිය ඇත.

43. වෙනත් ආකාරයකින් එකඟවී නොමැතිනම්, තැපැල් සහ/හෝ බැංකුවේ විද්‍යුත් සන්නිවේදන මාධ්‍ය ඔස්සේ සහ/හෝ බැංකුවට මැනැවැයි හැඟෙන වෙනත් සුදුසු ආකාරයකින් දැන්වීම් ලිඛිතව ගනුදෙනුකරුට ලබාදෙනු ඇත.

තැපැල් මගින් යැව්වේ නම් තැපැල් කළ දිනෙන් දින 2කට පසුව:

විද්‍යුත් තැපැල හෝ වෙනත් ඉලෙක්ට්‍රොනික ආකාරයකින් යැව්වේ නම්, එය යැවීමට අපොහොසත් වූ බවට වන දැන්වීමක් නොලැබුණි නම්( එවැනි අවස්ථාවකදී එය වෙනත් ආකාරයකට සන්නිවේදනය කරනු ඇත) එය යවා පැය 24කට පසුව :

දැන්වීම් බලාත්මක වනු ඇත.

දිනපතා පුවත්පත්වල, බැංකු ශාඛාවල, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රවල හෝ බැංකු වෙබ් පිටුවේ පළකිරීමෙන් ප්‍රසිද්ධ දැන්වීම් සිදුකළ හැකිය. එවැනි අවස්ථාවලදී, ඒවා ප්‍රදර්ශනය කළ අවස්ථාවේ සිට හෝ සන්නිවේදනය වූ බව බැංකුව ප්‍රකාශ කරන වෙනත් වේලාවක සිට දැන්වීම් බලාත්මක වේ.

ඉහත සඳහන් ආකාරයෙන් යවන ලද දැන්වීම් ප්‍රමාණවත් සහ නිසි දැන්වීමක් ලෙස සළකනු ඇති අතර, ගනුදෙනුකරු මත බැඳී පවතිනු ඇත.

ගනුදෙනුකරු තමා සම්බන්ධ කරගත හැකි තොරතුරු බැංකුව වෙත යාවත්කාලීන නොකළහොත්, දැනුම්දීම් නොලැබීම හේතුවෙන් පැන නැගෙන ඕනෑම පාඩුවක් ගනුදෙනුකරු විසින් දැරිය යුතුවේ. බැංකුවට අවසන් වරට ලබාදී ඇති ලිපිනය/ සම්බන්ධ කරගත හැකි තොරතුර මගින් තවදුරටත් ගනුදෙනුකරු හා සම්බන්ධ විය නොහැකි බව බැංකුව සාධාරණ ලෙස විශ්වාස කරන්නේ නම්, බැංකුව දැන්වීම් යැවීම අත්හිටුවීමට හෝ නතර කිරීමට හෝ හැකිය.

එවැනි අවස්ථාවකදී, ගනුදෙනුකරු එන්පීඅයිපී ගිණුමට අදාළ සියලුම දැනුම්දීම් අවශ්‍යතා අත්හැර දමනු ලැබේ.

44. මෙම නියමයන් සහ කොන්දේසි වලට අමතරව, බැංකුවේ පොදු ව්‍යාපාරික කොන්දේසි වල සංස්ථාගත කර ඇති නියමයන් සහ කොන්දේසි වලට ද එන්පීඅයිපී ගිණුම යටත් වන අතර ඒ සඳහා බැඳී සිටියි.

45. මෙම නියමයන් සහ කොන්දේසි, ශ්‍රී ලංකාවේ නීතීන් මගින් පාලනය වනු ඇත.

මෙහි අඩංගු නියමයන් සහ කොන්දේසි මා විසින් කියවා තේරුම් ගෙන ඒ මගින් බැඳී සිටීමට එකඟ වෙමි.

........................................................

ගනුදෙනුකරුගේ අත්සන

දිනය: